## ලේඛන සහකාර II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම්පත් කැඳවීම

### විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ලේඛන සහකාර II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2021

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/ET/3/1/25/1/1 හා 2011.07.12 දිනැතිව අනුමත කරන ලද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ලේඛන සහකාර තනතුර සඳහා අනුමත බඳවා ගැනීම් පටිපාටියේ 8 ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව ලේඛන සහකාර II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් 2021 දෙසැම්බර් මස 19 (ඉරිදා) දින පැවැත්වීමට කටයුතු කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

03. II වන ශ්‍රේණියේ ලේඛන සහකාරවරුන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

04. අයදුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. අංක 01 සිට 06 තෙක් ඡේද පළමුවන පිටුවට ද අංක 7 සිට ඉදිරියට ඇති ඡේද අනෙක් පිටුවට ද ඇතුලත් වන පරිදි "ඒ4" ප්‍රමාණයේ කඩදාසි වල පිළියෙල කරන ලද අයදුම් පත්‍රයෙහි අපේක්ෂකයාගේ අත්සන ආයතන/ අංශ ප්‍රධානියා මඟින් සහතික කර 2021 දෙසැම්බර් මස 08 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ "විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මාලිගාවත්ත, කොළඹ 10." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරේ විභාගයේ නම සඳහන් කල යුතුය. **admin@pensions.gov.lk** යන විද්‍යුත් ලිපිනයට ද අයදුම්පතෙහි පිටපතක් යොමු කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

05. අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය තහවුරු කල යුතුය. ඒ සඳහා පහත ලියවිලි භාවිත කළ හැක.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කල හැකිය. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කලහොත් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

06. අයදුම්පත් ඉදිරිපත් කර ඇති ලේඛන සහකාරවරුන් වෙත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් විභාග කාල සටහන සමඟ විභාග ප්‍රවේශ පත්‍ර 2021.12.10 දිනට පෙර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කල යුතුය. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

07. මෙම විභාගය සිංහල මාධ්‍යයෙන් පැවැත්වේ. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

08. සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතලිහක් (40% ක්) බැගින් ලබා ගත යුතුවේ.

09. අපේක්ෂකයන් පහත දැක්වෙන විෂයයන් ඇතුලත් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

| | විෂයය | මුළු ලකුණු | කාලය | විෂය අංකය |
|---|---|---|---|---|
| 1. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි | 100 | පැය 01 | 01 |
| 2. | පරිගණක දැනුම පරීක්ෂා කිරීම (මෙය ප්‍රායෝගික දැනුම මැන බැලීමේ පරීක්ෂණයකි) | 100 | පැය 01 | 02 |

10.1. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි විෂයය :-

I. සිවිල් විශ්‍රාම වැටුප් ක්‍රමය (1934 පෙබරවාරි 05 දිනැති අංක 02 දරණ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා සංශෝධන )

II. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (1898 අංක 01 දරණ වැන්දඹු අනත්දරු අරමුදල් පනත)

III. වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනත)

IV. සන්නද්ධ හමුදා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (1970 අංක 18 දරණ ) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනත

V. සන්නද්ධ හමුදා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (1998 අංක 60 දරණ ) වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනත

VI. පළාත් පාලන විශ්‍රාම වැටුප් ක්‍රමය (1974 අංක 16 දරණ පළාත් පාලන සේවා පනත 1952 පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත)

VII. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ක්‍රමය (1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් පනත)

(ඉහත සඳහන් සියළුම පනත් වලට අදාළ සියළුම සංශෝධන සහ යාවත්කාලීන කිරීම් ද අදාළ වේ)

10.2. පරිගණක දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණය (මෙය ප්‍රායෝගික දැනුම මැන බැලීමේ පරීක්ෂණයකි) Ms.Word, Excel, Access, Power point හා Computer Data entry පිළිබඳ හැකියාව මැන බලන ආකාරයේ ප්‍රායෝගික පරිගණක පරීක්ෂණයකි.

11. මෙම විභාගය සඳහා ප්‍රතිඵල නැවත සමීක්ෂණය සිදු නොකරනු ලබන අතර ප්‍රතිඵල සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

12. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

ඒ. ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

2021 නොවැම්බර් මස 26 වැනි දින
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාළිගාවත්ත
කොළඹ 10.

ඒ. ජගත් ඩී ඩයස්
අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.

ආදර්ශ අයදුම් පත්‍රය

## ලේඛන සහකාර II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2021

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 1
දෙමළ - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 මුල’කුරු අගට යොදා මුල’කුරු සමග නම :-
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා:- GUNAWARDANE M.G.B.
1.2 මුල’කුරු සමග නම :-
(සිංහලෙන් / දෙමළෙන්)
1.3 මුල’කුරු වලින් හැඳින්වෙන නම් :-
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.43 මුල’කුරු වලින් හැඳින්වෙන නම් :-
(සිංහලෙන් / දෙමළෙන්)

2.0 සේවා ස්ථානය හා ලිපිනය :-
2.1 සේවා ස්ථානයේ නම සහ ලිපිනය :-
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 සේවා ස්ථානයේ නම සහ ලිපිනය :-
(සිංහලෙන් / දෙමළෙන්)
2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය:
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 ස්ත්‍රී / පුරුෂ භාවය :-
ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

5.0 ඔබ ඉදිරිපත් වන විෂයය / විෂයයන් :-

| විෂයය | විෂය අංකය |
|---|---|
| | |
| | |

6.0 දැනට දරන තනතුර :-
6.1 තනතුර :-
6.2 පත්වීම් ලිපියේ අංකය :-
6.3 ලේඛන සහකාර තනතුරේ II ශ්‍රේණියට පත්වූ දිනය :-

7.0 අයදුම්කරුගේ සහතිකය :-

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් ගනු ලබන තීරණ වලට හා සියළු විධිවිධානයන්ට යටත් වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

..........................................................

අපේක්ෂකයාගේ / අපේක්ෂිකාවගේ අත්සන

දිනය :-

**සටහන** : තමාගේ ආයතන ප්‍රධානියා හෝ එම ආයතන ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු හෝ ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු / නිලධාරිනියක වන ...................................................................... මහතා/ මහත්මිය/ මෙනවිය ...................................... වැනි දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව සහතික කරමි.

..........................................................

සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව

දිනය :-
නම :-
පදවි නාමය :-
ලිපිනය :-

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

i ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්
ii මෙම නිලධාරියා / නිලධාරිනිය* මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් සපුරා ඇති බවත්
මම සහතික කරමි.
(*අනවශ්‍ය වචන කපා හරින්න)

.........................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

දිනය :-
නම :-
පදවි නාමය :-
ලිපිනය :-